# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.15 පැය 1435 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 742 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

**01. මාරක රිය අනතුරක් - දොරටියාව පොලිස් වසම.**

2025.04.15 වන අද දින අළුයම් කාලයේ දොරටියාව පොලිස් වසමේ කුරුණෑගල - දඹුල්ල ඒ-06 මාගර්යේ කුරුණෑගල උතුරු ඩිපෝව අසලදී දඹුල්ල දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය වූ කැබ් රථයක් ඊට ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි ත්‍රිරෝද රථයක ගැටී ත්‍රිරෝද රථයක හා යතුරු පැදියක ද ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් ත්‍රිරෝද රථයේ රියදුරු, පසුපස අසුනේ ගමන් ගත් දෙදෙනෙකු හා යතුරු පැදියේ පැදිකරු තුවාල ලබා කුරුණෑගල රෝහලට ඇතුලත් කිරිමේදි ත්‍රිරෝද රථයේ රියදුරු හා පසුපස අසුනේ සිටි පුද්ගලයෙකු මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 37 හා 43 වයස් වල පසුවන ගල්කිරියාගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මෙම අනතුර සිදු කළ කැබ් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මොහු බීමත්ව රිය පදවා ඇති බවට අනාවරණය වී ඇත. දොරටියාව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - අහංගම පොලිස් වසම.**

2025.04.15 වන දින අළුයම් කාලයේ අහංගම පොලිස් වසමේ ගාල්ල - මාතර ප්‍රධාන මාගර්යේ කි.මි. 134 – 135 කණුව අතර ප්‍රදේශයේදී ගාල්ල දෙස සිට මාතර දෙස ගමන් ගත් යතුරු පැදියක් පැදිකරුට වේගය පාලනය කර ගත නොහැකිව ඊට ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි කාර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු බරපතල තුවාල ලබා ගොන්නගහහේන රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ මාතර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රෝහලේ ගොන්නගහහේන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අහංගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි

**03. මාරක රිය අනතුරක් - ඇතිමලේ පොලිස් වසම.**

2025.04.14 වන දින සවස් කාලයේ ඇතිමලේ පොලිස් වසමේ ඇතිමලේ 22 කොටස සිට ඇතිමලේ දෙසට ධාවනය වූ ජීප් රථයක මාගර්යේ අයිනේ සිටි පදිකයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා තුවාල ලබා

ඇතිමලේ රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා මොණරාගල රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී 2025.04.15 වන අද දින මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 72 ක් වූ ඇතිමලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය ඇතිමලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ජීප් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. අයිස් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොටහේන පොලිස් වසම.

2025.04.15 වන දින අළුයම් කාලයේ කොටහේන පොලිස් වසමේ කොටහේන පොලිස් නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් අනුව මැල්වත්ත ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලි ග්‍රෑම් 230 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වූ දෙමටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

සැකකරු 2025.04.15 වන දින මාලිගාකන්ද ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතයි. කොටහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් ස්ථානය.

2025.04.12 වන දින සවස් කාලයේ ඇතිමලේ පොලිස් වසමේ හත්ආර ප්‍රදේශයේදී ඇතිමලේ පොලිස් ස්ථනයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා ගංජා ග්‍රෑම් 70 ක් සොයගෙන ගෙන ඇත. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩිදුර විමර්ශනයේදී ඉහත වැටලීමට අදාළව සැකකරු 2025.04.15 වන අද දින අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 46 ක් වන තෙනගල්ලන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**